මහ පොළොව අප සතුයි! එකමුතුව වැඩ කළොත් ජය බිමත් අත ළඟයි!!

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ මෙහෙයවීම යටතේ බැමිණිවත්ත කෘෂිකාර්මික පලද වර්ධන කමිටු ප්‍රදේශය, ආයතනයේ ක්ෂේත්‍ර පර්යේෂණ මධ්‍යස්ථානයක් ලෙස පැවැත්වේ. එම ප්‍රදේශයේ සමාජ-ආර්ථික දියුණුවට අදලව කෙරෙන නොයෙකුත් අත්හද බැලීම් අතරින් මෑතදි ක්‍රියාත්මක කළ සමූහ නිප්පාදන ප්‍රයත්නය පිළිබඳ කරුණු එකතුවකි.

කාලාන්තරයක් තිස්සේ එක කුඹුරු අක්කරයක වපසරියකින් කන්නෙකට ලැබුණු අස්වැන්න වී බුසල් 18 යි, නැත්නම් 20 යි, ඇයි මේවර අඩු අස්වැන්නක් ලැබෙන්නෙ?

කුඹුරු ගොවිතැන් කරන අය තම තමනට ඉඩ කඩ ලැබෙන වෙලාවට හානව; පෝරු ගානව; වී වපුරනව. නොයෙක් වෙලාවට අල්ලපු කුඹුරේ ගොයම් පැල හොඳට පැල වෙලා වැඩී ගෙන එන කොටවත් තමන්ගෙ කුඹුරුවල සී සෑම ආදී කටයුතු කර ගන්න සමහර ගොවීන්හට බැරි වෙනව. තනි තනිව ගොවිතැන් කරන කොට බොහෝ වේලාවට වල්පැල උදුරා දැමීම හෝ මර්දනය කිරීම, කලට වෙලාවට වතුර බැඳ තැබීම ආදිය කරන්න අමාරු වෙනව. සමහරවිට අතමිට මුදල් හිහකම නිසා පෝර දමන්න නැති අයත් මේ අතර ඉන්නව. තත්වය මෙහෙම නම් අස්වැන්න අඩු වෙන එක පුදුමයක් නොවෙයි.

මේ අයහපත් තත්ත්වයෙන් ගැලවෙන්න මගක් නැද්ද? සරු සාර මහ පොළාව මත හෙලන ඩාදියවලට ලැබෙන පල මෙතරම් ටිකක් නම් ඒ උත්සාහයෙන් වැඩක් ඇද්ද?

අනාදිමත් කාලයක් තිස්සේ වී ගොවිතැන් කටයුතු කරපු ලාංකික ජනකාවට එම ගොවි තැන් කටයුතු ගැන අවබෝධයක් නැති නිසා මෙවැනි දුප්පත් තත්වයක් ඇති වුනා ද? ගොවී ජනතාව තව තවත් දුප්පත් බවින් මුදවා ගන්නට මාර්ගයක් නැද්ද?

මේ ගැටලුවලට උත්තර හොයන්න ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීම් ආයතනය පොඩි අත්හද බැලීමක් කළා.

කැගල්ල දිස්ත්‍රික්කයේ, බැමිණිවත්ත පලද වර්ධන කමිටුවේ බල ප්‍රදේශයට අයත් වන මුළු ප්‍රදේශයම, ආයතනයේ ක්ෂෙත්‍ර පර්යේෂණ මධ්‍යස්ථානය හැටියට තෝරා ගෙන තියෙනව. මේ ප්‍රදේශය තුළ ගොවිකම් කටයුතු ගැනත්, සත්ව පාලනය ආදිය ගැනත් නොයෙක් අත්හද බැලීම් කරල ප්‍රදේශයේ සමාජ-ආර්ථික දියුණුව ඇති කරන්න ආයතනය උත්සාහ යක් දරනව.

මේ පර්යේෂණ මධ්‍යස්ථාන ප්‍රදේශයේ තියෙන මොල්ලිගොඩ කුඹුරු යාය කැගල්ල දිස්ත්‍රික්කයේ හොඳ සරුසාර අස්වැන්නක් ගන්න පුළුවන් යායක්. ඒ වුනත් බොහෝ කාලයක් තිස්සේ යායෙ ගොවි මහත්වරුන්ට එක කන්නෙකට ලැබිල තියෙන්නෙ අක්කර යකට වී බුසල් 18 ක්, 20 ක් තරම් සුළු ප්‍රමාණ යක්. ආයතනය උත්සාහ කළා මේ අස්වනු ප්‍රමාණය වැඩි කර ගන්න යෙදිය යුතු වැඩ වෙලක් හොයන්න.



පෝලන්තයෙන් පැමිණ ආයතනයේ වැඩ කටයුතුවලට උපදෙස් දෙන ගොවිතැන් කටයුතු පිළිබඳ දැන උගත් කෙනෙකුගේ මෙහෙයවීම යටතේ අත්හද බැලීමක් වශයෙන් මේ කුඹුරු යායේ තෝරා ගත් ලියැදි කිහිපයක, ගොවි මහතුන්ට එක කන්නයක දී එකමුතුව වී ගොවිතැන් කටයුතු කරන්න වැඩ පිළිවෙලක් සකස් කළා. යායෙ ගොවීන් 18 දෙනෙක් තෝරා ගෙන, ඔවුන්ට අයිති කුඹුරු අක්කර 20 ක පමණ ප්‍රමාණයක බිම් හිය, දෙහිය හෑම, පෝරු ගැම, පැල සිටුවීම, කෘමි නාශක බෙහෙත් ඉසීම, වල් පැලෑටි මර්දනය කිරීම ආදිය නියම කර ගත් දින වකවානුවක් ඇතුළත එකමුතුව කරන්න ඉඩ පහසුකම් සලසා දුන්න. මේ වැඩපිළිවෙලේ ප්‍රධාන පරමාර්ථය උනේ කලට වේලාවට යෙදවුම් සපයාදීලා බාධාවක් නැතුව ගොයම් කපා පාගාගන්නා තුරු ගොවිතැන් කටයුතු ටික කර ගන්න පහසු කම් සැලැස්සුවොත් අස්වැන්න වැඩි කර ගන්න පුළුවන්ද කියල සොයා බැලීමයි.

මේ කටයුත්තෙදී බැමිණිවත්ත පලද වර්ධන කමිටුව හුඟක් දුරට උදව් කළා. ගොවි මහතුන් 18 දෙනා තෝරා ගෙන, ඒ අයට ඕනෑ කරන පෝර, කෘමි නාශක ආදිය ණයට ලබා දෙන්න පලදවර්ධන කමිටුව ඉදිරිපත් වෙලා රු. 7,000/- ක් පමණ වැය කළා. මේ කාර්යයට සම්බන්ධ වුන ගොවි මහතුන්ට කලට වෙලාවට ණය මුදල් ලැබුණා. එකම වර්ගයක බිත්තර වී ලැබුණා, ඕනෑ කරන වෙලාවට පෝර ලැබුණ. ඒ අයගෙ වී වගාව බාධාවක් නැතුව හොඳට වැඩුන. ඉතින් ප්‍රතිඵලය කුමක් ද? අස්වැන්න වැඩි උනාද? ගොවි මහත්වරු මේ ක්‍රමය හොඳයි කියල පිළිගන්නවද?

ඇත්ත වශයෙන් ම මේ ක්‍රමය සියයට සිය යක්ම සාර්ථක උනා කියන්න පුළුවනි. පෙබරවාරි මාසෙ 26 වෙනිදු මේ කුඹුරුවල වප් මගුල පැවැත්වුනේ, ප්‍රදේශයේ ගොවි ජනතාවගේ ලොකු බලාපොරොත්තු ඇතුවයි. තමන් ලබන අස්වැන්න තුන් ගුණයකින් විතර වැඩි වී ඇති බව දකින ඔවුන්ගේ මුහුණු සතුටින් ඉතිරී ගියා. ඒ සෑම දෙනෙක් ම කියා හිටියෙ මේ ක්‍රමයට මුළු යායම වැඩ කිරීමට ඔවුන් සම්පූර්ණයෙන් ම කැමති බවයි.

තමන්ට ලැබෙන ආදායම තුන් ගුණයකින් විතර වැඩි වෙනව නම් එයට අකමැති කවුරුද?

පලදවර්ධන කමිටු ප්‍රදේශයට අයත් ගොවි කාරක සභා 16 න් 14 කම සාමාජිකවරු තමන්ගේ කුඹුරු යායවලටත් මේ ක්‍රමය යොදා ගැනීමට උදව් කරන ලෙස ඉල්ලා තියෙනවා.

ආයතනය මේ අත්හද බැලීම කළේ කුඹුරු ගොවිකැන ගැන පමණක් නොවෙයි. ඉඩම්



නැති 21 දෙනෙක් තෝරා ගෙන දිදුල වත්තෙන් ගොඩ ඉඩම් අක්කරය බැගින් දිලා කෙසෙල් වගාවක් එකමුතු ගොවිතැන් ක්‍රමයට අනුව දියුණු කරන්න වැඩ පිළිවෙලකුත් සකස් කළා. මේ ගොවි මහතුන්ට මූලික පහසුකම් හා කෙසෙල් පැල ණයට ලබා දුන්නෙ සීමාසහිත ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංවිධාන සංගම යෙන්. ණය මුදල් පියව ගන්නෙ කෙසෙල් වලින් ආදයම ලැබෙන කොටයි. ඒ වගෙම කෙසෙල් කැන් අලෙවි කිරීමත් අලෙවි සංවිධානය බාර ගෙන තියෙනවි.

මේ කටයුතු සංවිධානය කිරීමේදී මෙහෙය වීමේ උපදෙස් යනාදිය ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයෙන් ලැබුණත්, බැමිණිවත්ත කෘෂිකර්ම පලද වර්ධන කමිටුවත්, මාවනැල්ල විවිධ සේවා සමුපකාර සමිතියත් ආධාර උපකාර සැපයී මේදී හුහක්දුරට උදව් වුනා. ඒ වගේම කෘෂි කර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරීන්ගේ ද සහයෝගය නිරතුරුව ම ලැබුන.

සාමූහික ගොවිතැන් ක්‍රමය ගැන, ඊට සම් බන්ධ වුන එක එක අය අදහස් දැක් වූවෙ මේ විදිහටයි:-

මොල්ලිගොඩ වෙල්යායේ පළමුවරට සාමූ හික ගොවිතැන් ක්‍රමයට සම්බන්ධ වුන ගොවි මහතෙක්

''මේ ක්‍රමය හුහාක් හොඳයි. මං හිතන හැටියට බොහොම ඉස්සර කාලෙත් ගොවි තැන් කටයුතුවලදී මේ වගෙ ක්‍රම ලංකාවෙ තියෙන්න ඇති: ඇහැට පෙනෙන්නට දියුණු වක් තියන හින්ද අපි කවුරුත් මේ වගෙ වැඩකට කැමති වෙන්න ඕනෑ''.

බැමිණිවත්ත කෘෂිකර්ම පලදවර්ධන කම් ටුවේ සභාපතිතුමා —

''මේ වගෙ වැඩපිළිවෙලකින් පලද වර්ධන කම්ටුවෙ ක්‍රියාත්මක වැඩ සටහනට ලොකු රුකුලක් ලැබෙනව. ගොවි මහත්වරුන්ට වැඩි අස්වැන්නක් ලැබෙන කොට ණය මුදල් ආදිය ආපසු ලබා ගැනීමත් පහසුයි. ඒ වගේම එකමුතුව වැඩ කිරීමෙන් ප්‍රදේශයේ සමගිය තහවුරු කර ගැනීමටත් අනුබලයක් ලැබෙනව. මේ ක්‍රමය දිවයින පුරාම පතුරුවා හැරියොත් අඩු වශයෙන් සහල් වලින්වත් ස්වයං පෝෂිත බව ලබා ගන්නට අමාරු වෙන එකක් නෑ.''

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරී මහතෙක් —

''කට්ටියක් එකට වැඩ කරන කොට ව්‍යාප්ති කටයුතු කරන එකත් පහසුයි. එක එක ගොවි මහතෙක් ළහට ගොස් පුද්ගලිකව උපදෙස් දීමට වඩා කට්ටියකට එකවර උපදෙස් දීම පහසුයි.''

දිදුලවත්තේ සාමූහික කෙසෙල් වගා ව්‍යාපා රයේ නියැලි කාන්තාවක් —

''එකමුතුව වැඩ කළොත් අපි කාටත් ලේසියි; ඒ වගේම වාසියි''.